ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - **5** මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය **II - 2022/2023**

**LLU5810** ඉඩම් නීතිය

කාලය - පැය **1**

---

දිනය : **2023** දෙසැම්බර් **01** වේලාව: ප.ව. **03.30** – ප.ව. **04.30**

---

**එක් ප්‍රශ්නයකට පමණක් (01) පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

---

1. කොළඹ ප්‍රදේශයෙහි ජීවත් වන විවාහක කාන්තාවක් වන ලතා, සීගිරියෙහි පිහිටා ඇති *'කුරුළුගහලන්ද'* නම් ඉඩමේ හිමිකාරිය වේ. 2012 දෙසැම්බර් මාසයේ දී, ඇයගේ අසල්වැසියෙකු වූ රවී බලහත්කාරයෙන් එම ඉඩමේ සම්පූර්ණ භුක්තියට ඇතුළු වූයේය. එම ඉඩමට යාබද ඉඩම් හිමිකරුවෝ කිහිපදෙනෙකු විසින්ම රවීගේ පදිංචිය පිළිබඳව ලිඛිතව සහ දුරකථනයෙන් ලතාට පැමිණිලි කළහ. 2013 පෙබරවාරි මාසයේ දී, ඇය රවීට දන්වා සිටියේ වහාම එම ඉඩමේ පදිංචියෙන් ඉවත් වන ලෙසය. *'කුරුළුගහලන්ද'* ඉඩමේ පදිංචියෙන් ඉවත් වන ලෙසට ඇ විසින් නැවත නැවත කරන ලද ඉල්ලීම් නොසලකාහරිමින් රවී එම ඉඩමේ දිගටම පදිංචි වී සිටි අතර බඩ ඉරිඟු සිටුවා ඉන් ආදායම් ද ලැබුවේය. වර්ෂ 2017 අප්‍රේල් මාසයේ දී, ලතාගේ නීතිඥවරයා විසින් රවීට *'කුරුළුගහලන්ද'* ඉඩමෙන් ඉවත් වන ලෙස නැවත ලිඛිත දැන්වීමක් යවන ලද නමුත් ඔහු එම ඉඩමේ භුක්තියේ දිගටම සිටියේය. තවද, ඔහු කුඩා නිවසක් එහි ඉදිකළ අතර භූමියෙහි වැඩිදියුණු කිරීම් කිහිපයක් ද කළේය. ලතා මෙම ඉඩම විකුණා 2023 දෙසැම්බර් මස විදේශගත වීමට අපේක්ෂා කරයි.

   අ) *'කුරුළුගහලන්ද'* ඉඩමට කාලාවරෝධී අයිතිය අයැද සිටීමට රවී අදහස් කරයි. ඔහුට උපදෙස් දෙන්න. ඔබගේ පිළිතුර අදාළ විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් තහවුරු කරන්න.

   **(ලකුණු 13)**

   ආ) 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ලතා විදේශගතව සිටියේ නම්, ඔබ විසින් ඉහත (i) කොටසට දෙන ලද පිළිතුරෙන් මෙම පිළිතුර වෙනස් වන්නේ කෙසේ ද?

   **(ලකුණු 07)**

**(මුළු ලකුණු 13 +07 = 20)**

2. "1927 අංක 23 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 7 (1) වගන්තිය ලියාපදිංචි නොකළ ලේඛන අභිබවා ලියාපදිංචි කළ ලේඛන සඳහා පූර්වතාවය ලබා දෙයි."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද?

ඉහත ප්‍රකාශය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අ) පූර්වතාවය ඉල්ලා සිටීම සඳහා ඔප්පු කළ යුතු මූලික අවශ්‍යතා කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

ආ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ අදාල විධිවිධාන සහ නඩු තීරණ වලට අනුව පූර්වතාවය අහිමි වන්නේ කුමන හේතු යටතේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 12)**

**(මුළු ලකුණු 08 +12 = 20)**

***නිමිකම් ඇවිරිණි.***